**ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලයේ ගනුදෙනු පිළිබද වාර්තාව - 2019 , 2020 හා 2021**

---

ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලයේ 2019 , 2020 හා 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ තුන සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි<br>ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2022 දෙසැම්බර් 14 දින ඉදිරිපත් කර තිබුණු අතර 2019, 2020 ,2021 සහ 2022 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2019,2020,2021 යන වර්ෂවල මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට අවසන් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන<br>ඇති නමුත් 2018 වර්ෂයේ මූල්‍ය වාර්තා සඳහා විගණාධිපති මතය ඉදිරිපත් වී නොතිබුණු බැවින් ඉහත වර්ෂ සඳහා වාර්ෂික වාර්තා සකස් කිරීම ප්‍රමාද වී ඇති බව දන්වමි. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**විගණන නිරීක්ෂණය**

(අ)මණ්ඩලයේ යටතේ පවතින ගොවිපොළ 32 න් බෝපත්තලාව , ඩයගම , හොරකැලේ , මිරිස්වත්ත , රිදියාගම , රුක්කත්තන , සිරිංගපාත , මැණික්පාලම යන ප්‍රධාන ගොවිපලවල පසුගිය වර්ෂ කිහිපයක බදු පෙර ශුද්ධ ලාභය/අලාභය පහත පරිදි විය.

| ගොවිපොළෙහි නම | ලාභය /( අලාභය )රු.මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| බෝපත්තලාව | (13.12) | 6.87 | (21.53) | (48.74) | (59.85) |
| ඩයගම | (0.73) | 21.77 | (58.62) | (31.15) | (53.51) |
| හොරකැලේ | 60.51 | 46.79 | 89.02 | 85.88 | 66.55 |
| මිරිස්වත්ත | 6.97 | 21.60 | 42.46 | 20.84 | 26.73 |
| රිදියාගම | (15.85) | (128.05) | (424.51) | (8.05) | (165.40) |
| රුක්කත්තන | 16.82 | 12.82 | 13.51 | 8.85 | 13.38 |
| සිරිංගපාත | 38.46 | 18.69 | 39.83 | 15.65 | 14.73 |
| මැණික්පාලම | (44.73) | 26.61 | (85.21) | (132.11) | (132.68) |

උක්ත තොරතුරු අනුව හොරකැලේ, මිරිස්සවත්ත, රුක්අත්තන සහ සිරිංගපාතයන ගොවිපොළයන්හි බදු පෙර ශුද්ධ ලාභය ක්‍රමයෙන් අඩුවීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වන අතර බෝපත්තලාව, ඩයගම, රිදියගම සහ මැණික්පාලම යන ගොවිපොළවල් තවදුරටත් අලාභ තත්ත්ව වැඩිවිමේ ප්‍රවණතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

මිරිස්වත්ත ගොවිපළෙහි කුකුළු පැටවුන්ගේ විකුණුම් මිල පහත වැටිම සහ නිෂ්පාදන වියදම ඉහළ යාම හේතු කොටගෙන අලාභය වැඩි වී ඇත.

සිරිංගපාත ගොවිපළට අයත් අක්කර 500ක් ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයට ලබාදීමට සිදුවීම නිසා එහි පොල් ආදායම සම්පූර්ණයෙන්ම අහිමිවීමත් හොරකැලේ, සිරිංගපාත, රුක්අත්තන යන ගොවිපොළවල 2016 වර්ෂයේ පොල් මිල පහත වැටීම, 2017, 2018 යන වර්ෂවල පොල් නිෂ්පාදනයේ මෙහෙයුම් වියදම ඉහළ යාම අලාභය අඛණ්ඩව වැඩි වීමට හේතු වී ඇති බව දන්වමි.

මැණික්පාලම, ඩයගම හා බෝපත්තලාව ගොවිපොළවල් කිරි නිෂ්පාදනය අඩුවීම හා සතුන්ගේ අගය අඩුවීම හා 2015, 2016 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සතුන් අගය නිවැරදි ලෙස සිදු කර නොතිබිම සෘණාත්මක බලපෑම හේතුවෙන් එම වර්ෂවල ලාභය අඩු වි ඇත. රිදියගම ගොවිපොළ 2015 වර්ෂයේ ගවයින් 2500ක් ආනයනය කිරිම සිදු විය. විශාල වශයෙන් ආහාර හා නඩත්තු වියදම් දැරීමට සිදු විම නිසා අලාභයක් පෙන්වන ලදි.

**නිර්දේශය**

මණ්ඩලයේ යටතේ පවතින ගොවිපොළවල් ලාභ ලබන තත්වයට පත්කර ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට හා 2021 දෙසැම්බර් 31 දිනට අවුරුදු 5 ට වැඩි ණයගැති ශේෂ පිළිවෙලින් රු. 84,714,279 ක් හා රු.82,081,430 ක් විය. මෙම ණය ශේෂ අයකර ගැනිම අවිනිශ්චිත තත්ත්වයේ විය. | මෙම ණයගැති ශේෂයන් ඇතුළු මණ්ඩලයේ දිගුකාලීනව අය නොවූ ණයගැතියන් සම්බන්ධව තීරණ ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි ඇතුළු කමිටුවක් පත් කොට එම සියලු ණයගැතියන් විශ්ලේෂණය කොට සමාලෝචනය කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. | ණය අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය . |
| (ඇ) | පොල් සංවර්ධන අධිකාරිය මඟින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී මෙම අධිකාරිය විසින් නිකුත්කර ඇති නීති මාලාවන්ට අනුව නියමිත කාල තුළදී පොල් තොග ඉවත් කර නොගැනීම හේතුවෙන් තැරැව්කරුවන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වූ අවුරුදු 5 ට වැඩි හිඟ බිම්කුලි සහ දඩ රු.18,164,830 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට ඵලදායී පියවරන් ගෙන නොතිබුණි. | පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසියේ පනවා ඇති නීතිරීති මාලාවන්ට අනුකූලව මණ්ඩලය කටයුතු කර නොමැති බවට සිදු කර ඇති ප්‍රකාශය සමග එකඟ විය නොහැකි අතර අවුරුදු 15ට වැඩි ණයගැති ශේෂය අය කර ගැනිමට විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. | හිඟ බිම්කුලී හා දඩ මුදල් ශේෂ තැරැව්කරුවන්ගෙන් හෝ එම පොල් තොගය නිදහස්.කළ .වගකිව යුතු නිලධාරීන් ගෙන් අයකර ගත යුතුය. . |
| (ඈ) | 2011 වර්ෂයේ සිට වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් අයවිය යුතු රු.3,689,824 ක මුදල අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද අයකර ගැනිමට නොහැකි වී තිබුණි. | මෙම මුදල සම්බන්ධයෙන් අදාළ ආයතනයට ලිඛිතව දන්වා ඇති අතර එම ආයතනය මගින් පෙරලා දන්වා ඇත්තේ අදාළ වටිනාකම රේඛීය අමාත්‍යාංශය හරහා පියවීම සඳහා එවකට රේඛීය අමාත්‍යාංශයට දන්වා ඇති බවයි. ඒ අනුව අප විසින් මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් විමසීම් කර ඇති අතර අදාළ කරුණු තහවුරු කර ගැනිමෙන් පසු ඉදිරි පියවර ගැනිමට නියමිත බව දන්වමි. | වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) 2013 වර්ෂයේ සිට පැවත එන මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි රු.19,253,926 ක් 2021 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙහි දැක්වෙන රක්ෂණ වන්දි හිමිකම සම්බන්ධයෙන් විවිධ විමර්ශන, සාකච්ජා, ඉල්ලීම් ගණනාවක් සිදු කර ඇති අතර එම ගිණුම්වල සටහන් වටිනාකම අය කර ගත නොහැකි අගයක් බව සහ මේ වන විට විශාල කාලයක් ගත වී ඇති බැවින් නැවත විමර්ශණය කිරිම ඉතා අපහසු තත්ත්වයක් වන බැවින් ගිණුම් වල සඳහන් එම හිමිකම පොත් වලින් ලියා හැරිම සදහා අනුමැතිය ලබා ගැනිමට අපේක්ෂා කෙරේ. | ලැබිය යුතු රක්ෂණ වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

**2.2 අනුපාත විශ්ලේෂණය**

මණ්ඩලය විසින් ගිණුම් ඉදිරිපත් කර ඇති 2014 සිට 2018 දක්වා වූ වර්ෂ 5 ට අදාළ වැදගත් ගිණුම්කරණ අනුපාත පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන ගැටලුවක් පවතින බව පිළිගනු ලැබේ. ඉදිරියේදි එම ගැටලුව නිරාකරණය කර ගැනිමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | කාරක ප්‍රාග්ධන ගැටලුව නිරාකරණය කර ගැනිමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| ------- | -------- | ------- | ------ | -------- | -------- | | |
| ජංගම අනුපාතය | 0.79 | 0.42 | 0.37 | 0.75 | 0.59 | | |
| ක්ෂනික අනුපාතය | 0.51 | 0.24 | 0.21 | 0.49 | 0.38 | | |
| දළ ලාභ අනුපාතය | 37.32% | 37.25% | 33.8% | 27.06% | 19.09% | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 3.12% | 1.8□% | 0.33% | (52.5%) | (10.51%) | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | 9.86 | 11□86 | 16.92 | 0.09 | 0.07 | | |
| ස්ථාවර වත්කම් පිරිවැටුම් අනුපාතය | 1.23 | 0.85 | 0.91 | 0.49 | 0.48 | | |
| තෝලණ අනුපාතය | 1.76 | 3.47 | 3.35 | 0.08 | 0.08 | | |
| ණයගැති එකතු කිරීමේ කාලය | 37 | 31 | 22 | 32 | 27 | | |

උක්ත තොරතුරු අනුව මණ්ඩලයේ ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය 2014 වසරේ සිට 2018 වසර දක්වා ක්‍රමයෙන් හීන වී ඇති අතර එය ප්‍රශස්ත මට්ටමක නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මණ්ඩලයේ කාරක ප්‍රග්ධන

ගැටලුවක් ඇති බව නිරීක්ෂණය වේ. තවද දළ ලාභය හා ශුද්ධ ලාභය 2015 වසරේ සිට 2018 වසර දක්වා ක්‍රමයෙන් හීන වී ඇති අතර 2017 වසරන් පසුව ශුද්ධ අලාභයක් දක්වා හීන වී ඇත.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආනයනික ගවයන් සිටින රිදියාගම ගොවි ගොවිපොළෙහි ඖෂධ, එන්නත්, කිරි දෙවීම් හා ගව ගාල් නඩත්තු යන වියදම් ද ඇතුළු සෘජු වියදම් සඳහා 2021 වර්ෂයේ දී රු. මිලියන 714 ක් වී ඇති අතර එම සෘජු වියදම් දැරු පසු ව්‍යාපෘතියේ දළ අලාභය රු. මිලියන 16 වී තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ දී ගොවිපොළෙහි සෘජු වියදම් හෝ ආවරණය කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | 2021 වර්ෂයේ ගොවිපොළ තුළ වියදම් අධික වීමට හේතු සවිස්තරාත්මකව මීට පෙර ඉදිරිපත් කර ඇත. | ගොවිපොළ ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බෝපත්තලාව ගොවිපොළෙහි 2021 වර්ෂයේ දියර කිරි අළෙවි ආදායමේ නියැදියක් පරීක්ෂාවේදී පහත දෑ නිරීක්ෂණය විය. | | |
| (i) | 2021 වර්ෂයේ අවසන් කාර්තුව වෙනුවෙන් දියර කිරි අළෙවි කිරීම සඳහා දිනකට ලීටර් 3,000 ක් ලීටරය රු, 134 බැගින් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම් ගත වී තිබුණු නමුත් 2021 ඔක්තෝම්බර් මාසය තුළදී ගිවිසුම්ගත මිලට වඩා අඩුවෙන් විකිණීම මත ගොවිපොළට රු. 235,648 ක අලාභයක් සිදුවී තිබුණි. | ටෙන්ඩර් මිල රු.134 ක් වුවද Fat හා SNF අගය මත සියයට 12.5 ලෙස අඩු හෝ වැඩිවීම මත ශත 50ක් එකතු වීම හෝ අඩු වීම සිදු වේ. එම කාලය වැසි කාලයක් බැවින් මෙම ප්‍රතිශතය අඩු වීම මත මිල අඩු වී තිබේ. මෙය සාමාන්‍ය සිද්ධියකි. | දියර කිරි අළෙවි කිරීම ගිවිසුම්ගත මිලට සිදු කළ යුතුය. |
| (ii) | 2021 වර්ෂයේ තුන්වන කාර්තුවේදී ගොවිපොළ විසින් භාරදුන් කිරි ලීටර් ප්‍රමාණය හා කාර්ගිල්ස් ආයතනය මගින් භාරගත් කිරි ලීටර් ප්‍රමාණය අතර වෙනස්කම් පවතින බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව ගොවිපොළට දියර කිරි ලීටර් 1,704 ක් වෙනුවෙන් රු. 219,735 ක අලාභයක් සිදු ඇති බව නිරීක්ෂණය විය. | ගොවිපොළ හා කාගිල්ස් ආයතනය මිනුම් ඒකක (කිලෝ හා ලීටර්) දෙකක් යොදා ගැනීම නිසා මෙලෙස සිදුව ඇති අතර එකම මිනුම් ක්‍රමයක් දෙපාර්ශවය යොදා ගැනීම ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | ගිවිසුම්ගත ගත පරිදි කිරි අළෙවි කිරීම කළ යුතුය. |
| (ඇ.) | මැණික්පාලම ගොවිපොළෙහි පසුගිය 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කිරි ලබාගත හැකි ගවයන්ගේ ප්‍රමාණය 742 සිට 288 දක්වා අඩු වී තිබීමෙන් වර්ෂ | මෙම ව්‍යපෘතිය යටතේ ගොවිපොළ තුළ ඉපදුණු සියලු වැස්සි පැටවුන් ගොවින් අතර බෙදා හරින ලදි. වැස්සි පැටවුන් ගොවිපොළ තුළ නඩත්තු නොකිරීමෙන් | කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 08 ක් තුළ කිරි ගවයන් 454 ක් අඩුවීමත් කිරි ගවයන්ගේ කිරි නිෂ්පාදනයේ සාමාන්‍ය 14.78 සිට 12.60 දක්වා අඩුවීමත්, අඩු මිලට කිරි විකිණීමත් හේතුවෙන් ගොවිපොළෙහි කිරි අලෙවි ආදායම පහත වැටීමත් ගොවිපොළෙහි අලාභය වැඩිවීම කෙරෙහි සෘජුව බලපා ඇති බව නිරීක්ෂණය විය. | ගොවිපොළ තුළ සිටින කිරි දෙනුන්ගේ මරණ හා අනෙකුත් ආබාධ මත ගොවිපොළින් ඉවත්ව යන දෙනුන්ට ප්‍රමාණවත් ආදේශකයක් නොතිබූ බැවින් කිරි දෙනුන් ප්‍රමාණය සීඝ්‍ර ලෙස අඩු විම වසරින් වසර සිදු විය. ශ්‍රී ලංකාව තුළ නොතිබුණ ලෙඩ රෝග ඇති විම හා ඒ සඳහා අදාළ එන්නත් වර්ග ලංකාව තුළ නොතිබීම හේතුවෙන් මරණ ප්‍රමාණය ඉහළ යන ලදි. මේ නිසා අපේක්ෂිත මට්ටමින් ගොවිපොළ දෙනුන්ගේ ප්‍රමාණය අඛණ්ඩව පවත්වා ගැනිමට නොහැකි වීම මත ගොවිපොළ කිරි නිෂ්පාදනය අඩු විම සිදු විය. | |
| (ඇ) | බෝපත්තලාව හා මැණික්පාලම ගොවිපොළවල අමතර ආදායම් ලෙස ගොවිපළ භූමිය තුළ එළවළු වගා කටයුතු සිදුකර එළදාව ලබාගැනීමට කටයුතු කර තිබුණි. තොග වෙළෙඳුන් විසින් ලබාදෙනු ලබන දෛනික වැඩිම මිල අනුව අදාළ එළදාව අලෙවි කිරීමේ කටයුතු සිදුකළ යුතු වුවත් අර්තාපල් ,කැරට් හා ගෝවා විකුණුම් ආදායමට අදාළව සිදුකළ නියැදි පරීක්ෂාවේදී අඩු මිලට විකුණා තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව බෝපත්තලාව ගොවිපොළේ අර්තාපල් ,කැරට් හා ගෝවා සඳහා පිළිවෙලින් කිලෝග්‍රෑම් 25,282 ක් 4,121 ක් හා 11,990 ක් සඳහා රු. 316,232 ක , රු.102,429 ක හා රු.173,550 ක ආදායමක් ද අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | ගොවිපොළවල එළවළු අලෙවි කිරීමේදී මිල තීරණය කරනුයේ විකුණුම් මිල කමිටුව මගිනි.සමහර අවස්ථාවල ගැනුම්කරුවන් මිල ලබා දුන්න ද මිලට ගැනීම සඳහා නොපැමිණේ. එවිට ඊට වඩා අඩු මිලට විකිණීම සාමාන්‍යයෙන් සිදු වේ. සමහර ගැනුම්කරුවන් කෘතිම මිලක් මැවීම සඳහා ද වැඩි මිලක් ඉදිරිපත් කරයි. | දෛනික වැඩිම මිල අනුව අදාළ එළදාව අලෙවි කිරීමේ කටයුතු සිදුකළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ ගොවිපළ 26 ක එළ හා මී ගවයින් 10,088 ක් ඇත. එම ගවයින් සඳහා 2020 වර්ෂයේදී මසකට ගව ආහාර මෙට්‍රික් ටොන් 1,096.432 ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 13,157 ක් වැය වන අතර ඒ සඳහා රු. මිලියන 733,663 ක් හා 2021 වර්ෂයේදී මසකට ගව ආහාර මෙට්‍රික් ටොන් 938.807 ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 11,266 ක් වැය වන අතර ඒ සඳහා රු. මිලියන 726,893 ක් පුද්ගලික ආයතන සඳහා ගෙවා ඇත. පහත නිරීක්ෂණයන් කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (අ) | 2020 හා 2021 වර්ෂ සඳහා ආනයනික එළගව ව්‍යාපෘතිය ක්‍රියාත්මක මැණික්පාලම, ඩයගම, බොපත්තලාව හා රිදීයාගම යන ගොවිපළ 04 සැලකීමේදී එම ගොවිපොළවල සත්ව ආහාර වියදම කිරි ආදායමින් පිළිවෙලින් සියයට 53 ක් හා 63 ක් වේ.එසේම 2020 වර්ෂයේ අනෙකුත් එළගව ව්‍යාපෘති සහිත ගොවිපොළ 15 ක සත්ත්ව ආහාර වියදම කිරි ආදායමින් සියයට 60 ක් විය. ඒ අනුව ගව ආහාර සඳහා වූ වියදම පමණක් සැලකීමේ දී (බෙහෙත් හා විදුලිබලය වැනි වියදම් හැර) කිරි ආදායම වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | එවකට වෙළඳපොළෙහි පැවති මිල ගණන්වලට සාපේක්ෂව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි අලෙවි කර ඇත්තේ උපරිම මිලකට වේ. කිරි නිෂ්පාදන වියදම ඉහළ යෑම මණ්ඩලයට පාලනය කළ නොහැකි බාහිර සාධක වන කෘෂිකර්මාන්තය කඩා වැටීම, ආනයනික සීමා පැනවීම, සංචරන සීමා, කර්මාන්ත වැසී යාම ආදී විවිධ හේතු මත යෙදවුම් මිල ගණන් විශාල ලෙස ඉහළ යාම නිසා නිෂ්පාදන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. | කිරි නිෂ්පාදන පිරිවැය අඩුකර ගත යුතුය. |
| (ආ) | උපයෝජනය නොවන සත්ත්ව ආහාර නිපදවීමේ යන්ත්‍ර , අධික සත්ත්ව ආහාර වියදම හා කිරි ගව ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාවය සලකා බැලීමේදී ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව දෙවන වර්ෂයේ සිට ලාභ ලබන බවත්, 4 වැනි වර්ෂයේ සිට ලාභය ක්‍රමයෙන් 10 වන වර්ෂය දක්වා වැඩි වන බවත් දක්වා තිබූ නමුත්, 2012 හා 2013 වර්ෂ වල දී ආනයන කළ එළ ගවයින් රඳවා සිටින ගොවිපොළවල් සම්බන්ධයෙන් 2019,2020 හා 2021 වර්ෂවල මැණික්පාලම ගොවිපොළෙහි පිළිවෙලින් රු.72,532,028 ක, රු.21,078,530 ක හා 25,233,137 ක අලාභයක් ද , රිදියාගම ගොවිපොළෙහි පිළිවෙලින් රු.266,437,694 ක, රු.99,050,282 ක හා 213,944,24 ක අලාභයක් ද, බෝපත්තලාව ගොවිපොළෙහි පිළිවෙලින් රු.29,107,043 ක අලාභයක් , 4,628,164 හා 4,185,177 ක ලාභයක් ද , ඩයගම ගොවිපොළෙහි පිළිවෙලින් රු.32,280,028 ක අලාභයක් , 3,239,143 හා 4,627,726 ක ලාභයක් ද ලබා තිබුණි.ඒ අනුව එම ශක්‍යතා අධ්‍යයන වාර්තා සාවද්‍ය බව හා ව්‍යාපෘතිය අසාර්ථක බව නිරීක්ෂණය විය. | ශක්‍යතා අධ්‍යයනය සිදු කරන ලද කාල සීමාවේ පැවති ආර්ථික සාධක 2019,2020,2021 වර්ෂවල විශාල වශයෙන් වෙනස් විමට භාජනය වි තිබේ. එනම් උද්ධමනය අධික ලෙස ඉහළ යාම, පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ඇතිවූ බලපෑමට ඍජු ලෙස මෙම ගොවිපොළවල ලාභාලාභ ගිණුමට විශාල බලපෑමක් සිදු කර තිබේ. එබැවින් ඉහත අපගමනය සිදු වී ඇති බව අපගේ තක්සේරුවයි. | ගොවිපොළවල් ලාභ ලබන තත්ත්වයට ගෙන ආ යුතුය. |
| (ඇ) | 2020 පෙබරවාරි සිට සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට සත්ත්ව ආහාර මිලදී ගැනීම සඳහා මුදල් නොමැතිකම හේතුවෙන් එම ආයතනය පමණක් මවු කුකුළන් සඳහා වර්ග 2 ක ආහාර නිපදවීමට | සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය විශාල ආයෝජනයක් එකවර සිදු කළ යුතු වේ. විශාල පරිමාණයේ ආහාර නිෂ්පාදනය කරන ආයතනවලින් තරඟකාරි මිල ගණන් යටතේ මිලදී ගැනීම බොහෝ | මණ්ඩලය ලාභදායිත්වය ඉහළ දැමීමේ උපායමාර්ග ක්‍රියාත්මක කළ |

| | | | |
|---|---|---|---|
| | ආරම්භ කර තිබුණි. එමගින් පමණක් සමාගමට මාස 6 කට රු. 6,538,000 ක ඉතිරියක් වී තිබුණි. එම නිසා ගොවිපොළවල් අතරින් සමහර ගොවිපොළ ලබන සුළු ලාභය උපරිම කිරීමටත්, ලබාගන්නා අලාභය ලාභයක් බවට පත් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළ 3 ක් සතු කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 05, මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම සතු කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍රය, ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සතු කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 2 උපයෝගී කර ගෙන , උපයෝජනය නොකරන භූමිය භාවිතා කර ආහාර නිෂ්පාදනයට අවශ්‍ය වගා කළ හැකි මූලික අමුද්‍රව්‍ය (බඩ ඉරිඟු, සෝයා) නිෂ්පාදනය මඟින් හා සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ නව දැනුම ද උපයෝගී කරගෙන තත්ත්වයෙන් උසස් සත්ත්ව ආහාර නිෂ්පාදනයෙන් හා සත්ත්ව ආහාර වියදම අවම කර ගැනීමෙන් මණ්ඩලය ලාභදායීව පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබුණි. | විට වාසිදායක වේ. මණ්ඩලය අඩු ධාරිතාවයකින් යුත් ඉතා පැරණි යන්ත්‍රෝපකරණ වන අතර ඒවායේ කාර්යක්ෂමතාවය ද ඉතා අඩුය. එබැවින් පවතින අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරා ගත නොහැකි බැවින් හා බොහෝවිට නිෂ්පාදන පිරිවැය වැඩි වන බැවින් විවෘත තරගකාරී මිල ගණන් යටතේ බාහිර ආයතන වෙතින් සත්ත්ව ආහාර මිලදී ගැනිමට කටයුතු කරන ලදි. | යුතුයි. |
| (ඈ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය සඳහා මහපෙන්වීම් චක්‍රලේඛයේ 1.6 වර්ගීකරණයේ ශ්‍රේණිගත කිරීම් අනුව මණ්ඩලය B ශ්‍රේණියේ ආයතනයක් වන අතර එම මහ පෙන්වීමෙහි 5.2.2.(අ) අනුව B ශ්‍රේණියේ ආයතනයක ප්‍රාග්ධන ආයෝජනය රු.මිලියන 2.5 ට වඩා සිදුවන ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකල යුතු වුවත් රු. මිලියන 97.06 වටිනා ව්‍යාපෘති 11 ක් සඳහා එලෙස ශක්‍යතා අධ්‍යයනයක් 2021 වර්ෂයේ දී සිදුකර නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන රු.මි.2.5 වඩා වැඩි ව්‍යාපෘති ආයෝජන සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමට කටයුතු කෙරේ. | ප්‍රාග්ධන ආයෝජනය රු.මිලියන 2.5 ට වඩා වැඩි ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතුය. |
| (ඉ) | මැණික්පාලම හා බෝපත්තලාව ගොවිපොළවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුව භාවිතයට නුසුදුසු භාණ්ඩ (condemn) ලෙස 2020 වර්ෂයේ භාණ්ඩ අයිතම පිළිවෙලින් 153 ක් හා 1225 ක් ද , 2021 වර්ෂයේ භාණ්ඩ අයිතම පිළිවෙලින් 161 ක් හා 965 ක් ද ලෙස දක්වා තිබුනද එම භාණ්ඩ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි | අබිලි ද්‍රව්‍ය (භාවිතයට නුසුදුසු භාණ්ඩ) සලකා බලන වර්ෂයට අදාළව පත් කළ කමිටුව විසින් නිර්දේශ කළ පසු ඒවා වෙනමම වෙන්කර තබනු ලබයි. ඒ අනුව 2020 වර්ෂයේ අබිලි ද්‍රව්‍ය ප්‍රමාණයෙන් නැවත 2021 වාර්ෂික තොග සමීක්ෂණ වාර්තාවට ඇතුළත් කරනු නොලබන බැවින් ඒවා ඇතුළත් කර නොමැත. | භාවිතයට නුසුදුසු භාණ්ඩ අපහරණය කර නොමැති නම් භාවිතයට නුසුදුසු භාණ්ඩ (condemn) යටතේ දැක්විය |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාමාර්ග පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් 2022 මාර්තු 10 දින වන විටත් නිර්දේශ ලබාදී නොතිබිණි. මෙම භාණ්ඩ අයිතම 153 න් අයිතම 122 ක් හා භාණ්ඩ අයිතම 1,225 න් අයිතම 551 ක් 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී භාවිතයට නුසුදුසු භාණ්ඩ ලෙස හඳුනාගෙන නොතිබුණි.. | | යුතුය. |
| (ඊ) | මැණික්පාලම ගොවිපොළෙහි 2020 හා 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව sprinkler system යටතේ ඇති ඉංජිනේරු උපාංග 135 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. | මෙලෙස අයිතම 135 ඌණතාවයක් ඇති වීමට හේතුව බෝපත්තලාව හා මැණික්පාලම ජල අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ජල නල පද්ධතියක් ඉදිකිරීම සඳහා උපාංග භාවිතා කිරීම වේ. නමුත් මෙම බැහැර කිරීම, බැහැර කිරීමේ නිවේදන යොදා විධිමත්ව බැහැර කර නොමැති බව පිළිගනිමි. | ඉන්වෙන්ට්‍රි අයිතම සම්බන්ධයෙන් මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතුය. |
| (උ) | බෝපත්තලාව ගොවිපොළෙහි 2021 මූල්‍ය ප්‍රකාශන වලට අනුව වෙළඳ සහ අනෙකුත් තොග යටතේ දක්වා ඇති වටිනාකම රු. 78,702 ක් වූ පාරභෝගික ද්‍රව්‍ය භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් භෞතිකව තහවුරු කරගෙන නොතිබුණි. | මෙය පොල් ගෙඩි 1136 ක් සඳහා වන වටිනාකමක් වන අතර එය වාර්ෂික තොග සමීක්ෂණ කමිටුව විසින් වාර්ෂික තොග සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් කර නොතිබීම වරදක් වන අතර, මින් ඉදිරියට මෙවැනි දුර්වලතා ඇති නොවන පරිදි කටයුතු කරමි. | වාර්ෂික තොග සමීක්ෂණ නිවැරදි ලෙස කළ යුතුය. |
| (ඌ) | මැණික්පාලම හා බෝපත්තලාව ගොවිපොළවල 2021 ජූලි - දෙසැම්බර් දක්වා මාස වල සත්‍ය මුළු කිරි නිෂ්පාදනය ලීටර් පිළිවෙලින් 578,620 ක් හා 497,591 ක් වන නමුත් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙවන අර්ධ වර්ෂයේ දී නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන මුළු කිරි නිෂ්පාදනය කිරි ලීටර ප්‍රමාණය පිළිවෙලින් 788,256 ක් හා 635,888 ක් වේ. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මේ දී නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන නිෂ්පාදනයෙන් සත්‍ය වශයෙන් ම නිෂ්පාදනය කළ කිරි ලීටර ප්‍රමාණය පිළිවෙලින් සියයට 73 ක් හා සියයට 78 ක් වේ. | ආනයනික කිරි දෙනුන් ක්‍රමයෙන් වයස්ගත වීමක් සමග නිෂ්පාදන ඵලදායීතාවය අඩුවන බැවින් එම ගවයින්ගේ වයස අවුරුදු 5 ඉක්මවන විට හා කිරි මුර අංක 3න් පසු නිෂ්පාදනය අඩුවන බැවින් එලෙස නිෂ්පාදන ඉලක්කය අඩු කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ගොවිපොළවල කිරි නිෂ්පාදනය වැඩිකර ගත යුතුය. |
| (එ) | 1974 හා 1992 යන වර්ෂවල සිට මණ්ඩලය විසින් පවත්වාගෙන එන ගොවිපොළ 25 කට අයත් ඉඩම් අක්කර 24,382.11 අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් සහ .ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව එම ඉඩම්වල ගොඩනැගිලි හා ව්‍යුහයන් ඉදිකර තිබුණි. ඉඩම් | පිළිතුරු ලබා දී නොමැත | ඉඩම් අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මන්දගාමී තත්ත්වය හේතුවෙන් ගැසට් මගින් අයිතිය ලබා දීම ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ඒ) | සී/ස කුකුළු පාලන සංවර්ධන සමාගම සම්බන්ධයෙන් 2020 මාර්තු 12 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අංක අමප/20/0890/217/052 දරන 2020 ජුනි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දැනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට සියයට 100 ක් කොටස් හිමි සී / ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්) සමාගම විසුරුවා හැරීමටත් , එම සමාගම සතු සියලු වත්කම් හා බැරකම් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීමටත් , එම සමාගම සතු එකම ගොවිපොළ වන මාවත්ත ගොවිපොළෙහි කාර්ය මණ්ඩලය ඔවුන්ගේ අයිතිවාසිකම් රැකෙන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත අන්තර්ග්‍රහණය කර ගැනීමටත් , මාවත්ත ගොවිපොළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළක් ලෙසින් පවත්වා ගෙන යාමටත් නියමකර තිබුණු නමුත් සමාගම විසුරුවා හැර සියලු වත්කම් හා බැරකම් පවරා ගැනීමත් කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කරගැනීමත් 2022 දෙසැම්බර් 31 දින දක්වාම සිදුකර නොතිබුණි. | සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීම සම්බන්ධයෙන් මූලික කරුණු ඉටු කර ඇති අතර ඈවරකරුවෙකු පත් කර ඇත. 2022 නොවැම්බර් මස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇති අතර ඊට සමගාමීව සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන සමාගමේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පෙබරවාරි මස පත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව ඈවරකරු විසින් ඉදිරි ක්‍රියාමාර්ග කෙටිකලක් ඇතුළත නිම කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සී / ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්) සමාගම විසුරුවා හැරීමටත් , එම සමාගම සතු සියලු වත්කම් හා බැරකම් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඔ) | අමප 15/0940/631/018-1 දරන 2015 ජුලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණ පරිදි සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට අයත් සියලුම සම්පත්, වත්කම්, කොටස් හා කළමනාකරණය අදාළ නීතිමය ක්‍රියාවලීන්ට යටත්ව කොටස් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත් කරගත යුතු බවට දන්වා ඇත. 2021 දෙසැම්බර් 31 දින දක්වා සමාගමෙහි කොටස් අයිතියෙන් සියයට 27 ක් පමණක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත්කරගෙන තිබුණු අතර සෙසු කොටස් වලින් මහවැලි අධිකාරිය සතුව සියයට 45 ක් ද, නෙදර්ලන්ත ෆිනෑන්සින් සතුව සියයට 23 ක් හා මහවැලි කලාපයේ ගොවීන් සතුව සියයට 05 ක් ද වශයෙන් අයිතිව තිබුණි. | සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම මහවැලි අධිකාරිය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නෙදර්ලන්ත සමාගමක් සහ ගොවි සංවිධානයක් යන පාර්ශව වලින් කොටස්කරුවන් සමන්විත වේ. එහි වැඩිම කොටස් හිමි මහවැලි අධිකාරිය වසර ගණනාවක් තිස්සේ කරන ලද ඉල්ලීම් වලට අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට කොටස් පැවරීමට කටයුතු කර නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සමාගමට අයත් සියලුම සම්පත්, වත්කම්, කොටස් හා කළමණාකරණය අදාළ නීතිමය ක්‍රියාවලීන්ට යටත්ව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් අත් කරගත යුතුය. |

මෙම කොටස් පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරාගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාවලීන් අනුගමනය කිරීමක් 2022 දෙසැම්බර් 31 දින දක්වා ම සිදුකර නොතිබුණි.

**3.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා මහ බැංකු වාර්ෂික වාර්තා අනුව 2019, 2020 හා 2021 වර්ෂ තුළ රටෙහි සමස්ත කිරි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර 374,015,943ක් 413,635,518ක් හා 425,369,628 ක් ද පොල් නිෂ්පාදනය ගෙඩි 3,086,000,000ක් 2,792,000,000 ක් හා 3,120,000,000 ක් ද කුකුළු නිෂ්පාදනය සතුන් 20,411,050ක් 24,277,830ක් හා 24,310,690 ක් ද වූ අතර එයින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය ලීටර 12,432,324ක් , 12,027,883 ක් හා 9,774,168 ක් ද පොල් නිෂ්පාදනය ගෙඩි 18,606,035 ක් 13,860,239ක් 17,018,801 ක්ද කුකුළු නිෂ්පාදනය සතුන් 2,763,600ක් 3,034,226 ක් හා 3,084,591 ක් ද පමණක් විය. ඒ අනුව මණ්ඩලයේ දායකත්වය කිරි නිෂ්පාදනයෙන් සියයට 3.32 ක් , 2.91ක් හා 2.3 ක් ද පොල් නිෂ්පාදනයෙන් සියයට 0.6 ක් , 0.5 ක් හා 0.55 ක් ද කුකුළු නිෂ්පාදනයෙන් සියයට 13.54ක් ,12.5 ක් හා 12.69 ක්ද වූයෙන් දායකත්වය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | මණ්ඩලයේ කිරි දෙනුන්ගෙන් වාර්ෂිකව කිරි ලීටර් මිලියන 10 ක් ලබා ගන්නා අතර එක් සතෙකුගෙන් දිනකට කිරි ලීටර් 7ක් පමණ ලබාගනී. ලංකාවේ කිරි නිෂ්පාදනය දිනකට ලීටර් ලක්ෂ 10 ක් පමණ වන අතර එක් කිරි දෙනෙකුගෙන් ලබා ගන්නා ප්‍රමාණය ලීටර් 2-3 පමණ වේ. තවදුරටත් මණ්ඩලය සතු කිරි ගොවිපොළවල නිෂ්පාදන හැකියාව වැඩිදියුණු කරමින් උපරිම නිෂ්පාදනයක් සිදු කිරීමට සැළසුම් කර ඇත. තවද රටෙහි මුළු කුකුළු ගහනයට සාපේක්ෂව මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන්නේ 1%-2% පමණ ප්‍රමාණයකි. . ප්‍රග්ධන ආයෝජන සිදුකළ යුතු වුවත් ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම නිෂ්පාදන වැඩි කිරීමේ දී බාධාවක් වී ඇත. පොල් වගාවට අවශ්‍ය පොහොර ලබා ගැනීමට නොහැකි වීමෙන් පොල් නිෂ්පාදනයේ අඩුවක් පවතී. | මණ්ඩලයේ ගොවිපොළවල සම්පත් ඵලදායි ලෙස භාවිතයෙන් වෙළෙඳ පොළ කොටස වැඩිකිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කන්තලේ උක් වගා භූමියේ අක්කර 1,000 ක ඉඩමක බඩ ඉරිඟු ව්‍යාපෘතියක් වෙනුවෙන් නැගෙනහිර නවෝදය යටතේ චක්‍රීය අරමුදලක් ඇති කිරීමට 2007 ජුනි 28 දින මණ්ඩලය වෙත රු.මිලියන 37.55 ක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2011 සැප්තැම්බර් 11 දින ඉඩම සීනි සමාගම වෙත පවරන අවස්ථාවේ බඩ ඉරිඟු ව්‍යාපෘතිය යටතේ පැවති චක්‍රීය අරමුදලේ ඉතිරි මුදල් වන රු. 17,549,342 ක් මහ බැංකුවේ අදහස් දැක්වීම හා 2007 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට යොමු කළ යුතුව තිබුණද, එසේ සිදු නොකොට ඉන් රු. 4,253,795 ක් වියදම් කර ඇති අතර ඉතිරි රු. 13,295,637 ක් පමණක් 2011 වර්ෂයේ සිට ස්ථාවර තැන්පතු යටතේ තැන්පත් කර තිබුණි. | එකඟ වේ. වියදම් කර ඇති මුදල මණ්ඩලයේ සතුන් සඳහා බඩ ඉරිඟු, තෘණ වගා කිරීම හා තෘණ වගා සංවර්ධනයට යොදවා ඇති බව දන්වමි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉතිරි මුදල මහා භාණ්ඩාගාරයට යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මැණික්පාලම ගොවිපොළෙහි ආගනන වාර්තාව පරිදි එළගවයන්ගෙන් ලබාගත හැකි දෛනික සාමාන්‍ය කිරි ප්‍රමාණය එම සතුන්ගේ වටිනාකම සමඟ සැසඳීමේදී දෛනික සාමාන්‍යය වැඩි කිරි ප්‍රමාණයක් ඇති සතුන් සඳහා අඩු වටිනාකමක්ද දෛනික සාමාන්‍යය අඩු කිරි ප්‍රමාණයක් ඇති සතුන් සඳහා වැඩි වටිනාකමක් ලෙස සතුන් අගය කර තිබුණු අතර ඒ අනුව දෛනික සාමාන්‍යය කිරි ප්‍රමාණය සැලකිල්ලට නොගෙන සතුන්ගේ බර පමණක් සැලකිල්ලට ගෙන ඇති බව නිරීක්ෂණය විය . | එකඟ වේ. සතුන්ගේ බර සඳහා සතුන්ගේ කිරි මුරය පදනම් කරගෙන සතුන් අගය කර ඇති අතර සාමාන්‍යය කිරි නිෂ්පාදනය සමාන අගයන් ගත්ත ද කිරි මුරය ඉහළ තත්ත්වයක එම සතුන් පසුවේ නම් එම සතුන්ගේ කිරි අලෙවි කිරීමේ වටිනාකම අඩු අගයක් ගන්නා බව දන්වමි. | සතුන් අගය කිරීමේදී නිවැරදි ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | බෝපත්තලාව ගොවිපොළෙහි 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාවිතයට නුසුදුසු භාණ්ඩ අයිතම 1,225 අතුරින් පොල් ගෙඩි 453 ක් ද රතු සහල් 348 kg විය. එමෙන්ම 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාවිතයට නුසුදුසු භාණ්ඩ අයිතම 965 අතුරින් පොල් ගෙඩි 643 විය. මේ අනුව වෙනත් ගොවිපළවල් මගින් ගෙන්වාගෙන ඇති එම හාල් හා පොල් තොග භාවිතයට ගැනීම හෝ විකිණීම නොකර නෂ්‍ට වීමට ඉඩ හැර ඇති බව නිරීක්ෂණය විය. | අදාළ වර්ෂය තුළ ගොවිපොළ සේවකයන්ට සහන මිලට අලෙවි කිරීම සඳහා රැගෙන එන ලද මෙම සහල් තොග ප්‍රවාහනයේදී වූ සිදු වූ හානි වීම් නිසා පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීම නිසා ඒවා ඉතිරිව පැවතින. එමෙන්ම සහෝදර ගොවිපොළවලින් ගොවිපොළ සේවකයන්ට නිකුත් කිරීමට ගෙනා පොල් තොග තේරීමෙන් ඉතිරිවූ ඒවා බව දන්වමි. | භාවිතයට නුසුදුසු භාණ්ඩ නිවැරදි ක්‍රමවේදයකට අපහරණය කළ යුතුය. |

### 3.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක් සතුව දිනකට එක් වරකදි ගව ආහාර ටොන් 3.75 ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4ක් පවතී. ඒවායින් මසකට ගව ආහාර මෙ.ටො 900 (3.75*දින 30* පැය 8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 10,800 ක් නිෂ්පාදනය කළ හැකි වුවද යන්ත්‍ර වසර 01 සිට වසර 12 දක්වා කාලයක් නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය. | සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය විශාල ආයෝජනයක් එකවර සිදු කළ යුතු වේ. විශාල පරිමාණයේ ආහාර නිෂ්පාදනය කරන ආයතනවලින් තරගකාරි මිල ගණන් යටතේ මිලදී ගැනීම බොහෝ විට වාසිදායක වේ. මණ්ඩලය අඩු ධාරිතාවයකින් යුත් ඉතා පැරණි යන්ත්‍රෝපකරණ වන අතර ඒවායේ කාර්යක්ෂමතාවය ද ඉතා අඩුය. එබැවින් පවතින අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරා ගත නොහැකි බැවින් හා බොහෝවිට නිෂ්පාදන පිරිවැය වැඩි වන බැවින් විවෘත තරගකාරි මිල ගණන් යටතේ බාහිර ආයතන වෙතින් සත්ත්ව ආහාර මිලදී ගැනිමට කටයුතු කරන ලදි. | නිෂ්කාර්යව ඇති ගව ආහාර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර භාවිතයට ගත යුතුය . |
| (ආ) | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළ 4 ක් සතුව කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 04 ක් ඇත. ඊට අමතරව මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 1 ක් ද , ශ්‍රී ලංකා | සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය විශාල ආයෝජනයක් එකවර සිදු කළ යුතු වේ. විශාල පරිමාණයේ ආහාර නිෂ්පාදනය කරන ආයතනවලින් තරඟකාරි මිල ගණන් යටතේ මිලදී ගැනීම බොහෝ විට වාසිදායක වේ. මණ්ඩලය අඩු ධාරිතාවයකින් යුත් ඉතා පැරණි | නිෂ්කාර්යව ඇති කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 2ක්ද පවතී. මෙයින් කුකුළු ආහාර මසකට මෙට්‍රික් ටොන් 2,580 (10.75*දින 30* පැය8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 30,960 ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. නමුත් 2021 දෙසැම්බර් 31 දිනට එම යන්ත්‍ර 8 වසර 01 සිට වසර 12 දක්වා කාලයක් නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය. | යන්ත්‍රෝපකරණ වන අතර ඒවායේ කාර්යක්ෂමතාවය ද ඉතා අඩුය. එබැවින් පවතින අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරා ගත නොහැකි බැවින් හා බොහෝවිට නිෂ්පාදන පිරිවැය වැඩි වන බැවින් විවෘත තරඟකාරි මිල ගණන් යටතේ බාහිර ආයතන වෙතින් සත්ත්ව ආහාර මිලදී ගැනීමට කටයුතු කරන ලදි. | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සි/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම හා සි/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන ( පුද්ගලික) සමාගම යන සමාගම් තුනට හෙක්ටයාර් 12,617.43 ක භූමියෙන් හෙක්ටයාර් 2,311.35 ක් උපයෝජනය නොවන භූමි කොටස් ඇති බව අනාවරණය විය. | එම ඉඩම් වලින් සැළකිය යුතු ප්‍රමාණයක් සංවේදි කලාප වන<br>උදා :- ජල පෝෂක ප්‍රදේශ . සත්ත්ව හා ශාක සංරක්ෂිත ප්‍රදේශ යනාදීය ස්ථිර භාවිතය සඳහා යොදා ගත නොහැකි ස්ථාන ලෙස පිහිටා ඇත. එම භූමි ප්‍රදේශ භාවිතා නොකරනු ලබන කොටස් ලෙස දැක්වුවද ඒවා සතුන්ගේ භාවිතය සඳහා යොදා ඇත. | උපයෝජනය නොවන ඉඩම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර , ඉන්පසු එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 දක්වා ඇති කරුණු ද ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කළ යුතු නමුත් එවැනි කරුණු ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි | ඉදිරියේදි එම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව ප්‍රසම්පාදන කාලසටහනක් සකසා අදියර 1 හා අදියර 2 පරිදි නිසි කළමනාකරණයක් සිදුකළ යුතු වුවත් 2019 , 2020 හා 2021 වර්ෂවල ප්‍රසම්පාදන සැලස්ම තුළ ඇතුළත් සියලුම මිල දී ගැනීම්වල ආරම්භක දිනය ඒ ඒ වර්ෂවල ජනවාරි 01 හා අවසාන දිනය ඒ ඒ වර්ෂවල දෙසැම්බර් 31 ලෙස දක්වා තිබුණු අතර මිලදී ගැනීම් සිදුකළ යුතු නිශ්චිත කාලසීමාවක් සඳහන් කර නොතිබුණි. | ඉදිරියේදි එම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සත්ත්ව ආහාර මිලදී ගැනීම සම්බන්ධයෙන් 2019 වර්ෂයේ අයවැය ලේඛනයෙන් වෙන්කර ඇති මුදල් ප්‍රමාණයට වඩා 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ මිලදී ගැනීමට අපේක්ෂා කරන වටිනාකම ගොවිපොළ 06 ක රු.2,345,095 ක සිට රු.11,395,496 ක පරාසයක් වන ලෙස එකතුව රු.30,336,379 ක් වැඩියෙන් ද , ගොවිපොළ 09 ක රු.400,000 ක සිට රු.10,344,089 ක පරාසයක් වන ලෙස එකතුව රු.35,711,445 ක් අඩුවෙන් ද දක්වා ඇති බව නිරීක්ෂණය විය. ඊට අමතරව ගොවිපොළවල් 04 ක සත්ත්ව ආහාර මිලදී ගැනීමේ වියදම ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදි එම අඩුපාඩු මගහරවා ගැනිමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනයේ තොරතුරු එකිනෙකට සැසඳිය යුතුය |
| (ඈ) | පොහොර මිලදී ගැනීම සම්බන්ධයෙන් ගොවිපොළ 07 ක 2019 වර්ෂයේ අයවැය ලේඛනයෙන් වෙන්කර ඇති මුදල් ප්‍රමාණයට වඩා 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ මිලදී ගැනීමට අපේක්ෂා කරන මුළු වටිනාකම රු.41,012,859 ක් වැඩියෙන් ද ගොවිපොළ 09 ක මුළු වටිනාකම රු.13,251,841 ක් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. ඊට අමතරව ගොවපොළවල් 06 ක පොහොර මිලදී ගැනීමේ වියදම අයවැයෙන්ද, ගොවිපොළවල් 03 ක පොහොර මිලදී ගැනීමේ වියදම ප්‍රසම්පාදන සැලැස්මෙන් ද අත්හැර තිබුණි. | ඉදිරියේදි එම අඩුපාඩු මගහරවා ගැනිමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනයේ තොරතුරු එකිනෙකට සැසඳිය යුතුය |
| (ඉ) | මණ්ඩලයේ ගොවිපොළවල් 17 ක් සඳහා 2020 වර්ෂයේ පොහොර වියදම රු.61,605,729 ක් හා ගොවිපොළවල් 04 සඳහා පශුවෛද්‍ය/බෙහෙත් ද්‍රව්‍ය වියදම රු.2,243,180 ක් වන ලෙස ඇස්තමේන්තුගත කර තිබුණද , එම වියදම් ප්‍රසම්පාදන සැලැස්ම තුළ දී සැලසුම් කර නෙතිබුණි. | ඉදිරියේදි එම අඩුපාඩු මගහරවා ගැනිමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව සකස් කළ යුතුය |
| (ඊ) | පොළොන්තලාව ගොවිපොළ සඳහා 2020 වර්ෂයේ ගව ආහාර වියදම අයවැය ලේඛනයේ රු.424,075 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණද , එම ගොවිපොළ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම තුළ දී ගව ආහාර වියදම සැලසුම් කර නොතිබුණි. | ඉදිරියේදි එම අඩුපාඩු මගහරවා ගැනිමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනයේ තොරතුරු එකිනෙකට සැසඳිය යුතුය. |
| (උ) | සත්ත්ව ආහාර මිලදී ගැනීම සම්බන්ධයෙන් 2021 වර්ෂයේ අයවැය ලේඛනයෙන් වෙන්කර ඇති මුදල් ප්‍රමාණයට වඩා 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ මිලදී ගැනීමට අපේක්ෂා කරන | ඉදිරියේදි එම අඩුපාඩු මහහරවා ගැනිමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනයේ |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම ගොවිපළ 02 ක රු.500 ක සිට රු.56,117,036 ක පරාසයක් වන ලෙස වැඩියෙන් ද , ගොවිපළ 03 ක රු.365 ක සිට රු.3,384,545 ක පරාසයක් වන ලෙස අඩුවෙන් ද දක්වා ඇති බව නිරීක්ෂණය විය. | | තොරතුරු එකිනෙකට සැසඳිය යුතුය. |
| (ඌ) | පොහොර මිලදී ගැනීම සම්බන්ධයෙන් ගොවිපොළ 01 ක 2021 වර්ෂයේ අයවැය ලේඛනයෙන් වෙන්කර ඇති මුදල් ප්‍රමාණයට වඩා 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ මිලදී ගැනීමට අපේක්ෂා කරන වටිනාකම රු.44,540 ක් වැඩියෙන් ද ගොවිපොළ 05 ක මුළු වටිනාකම රු.1,231,024 ක් අඩුවෙන් ද දක්වා ඇති බව නිරීක්ෂණය විය. ඊට අමතරව ගොවිපොළවල් 03 ක පොහොර මිලදී ගැනීමේ වියදම ප්‍රසම්පාදන සැලැස්මෙන් අත්හැර තිබුණි. | ඉදිරියේදී එම අඩුපාඩු මගහරවා ගැනිමට කටයුතු කිරිමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනයේ තොරතුරු එකිනෙකට සැසඳිය යුතුය. |
| (එ) | රිදියාගම ගොවිපොළේ තෘණ වගාව සංවර්ධනය සඳහා විසිරුම් ජල පද්ධති 4 ක් හා වතුර පොම්ප 2 ක් මිලදී ගැනීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මෙම ප්‍රසම්පාදනය සඳහා වැඩ බලන සාමාන්‍යාධිකාරී විසින් 2019 මැයි 22 දින පිරිවිතර හා ලංසු ලේඛන සැකසීම සඳහා සමාජිකයන් 03 දෙනෙකුගෙන් යුතු තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර තිබුණි.2019 අගෝස්තු 21 දින සභාපති විසින් නැවත සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් ලංසු ඇගයීම සඳහා පත් කර ඇති අතර එදිනම වැඩබලන ගොවිපොළෙහි සහකාර කළමනාකරුව තාක්ෂණික ඇගයීම් කමිටුවට අමතරව පත් කර තිබුණි. ඒ අනුව පළමු කමිටුවේ සාමාජිකයන් ඉවත් කර ලංසු ඇගයීම සඳහා නැවත එම සාමාජිකයින්ගෙන් දෙදෙනෙකු ඇතුළත් සාමාජිකයින් 6 දෙනෙකු ගෙන් යුත් තාක්ෂණික කමිටුවට පත් කර තිබුණු නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ප්‍රකාරව දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුවෙහි උපරිම සාමාජිකයන් ගණන 5 ක් විය යුතුය. | සාමාජිකයින් පස් දෙනකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් මණ්ඩලයේ සභාපතිතුමා විසින් පත් කර ඇත. පසුව 2021.08.21 දිනැති ලිපිය මගින් වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා විසින් නැවත තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා රිදියගම ගොවිපොළෙහි වැඩබලන කළමනාකාරවරයා පත් කර තිබුණි. සමාජිකයන් හය දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කළ නොහැකි බව පිළිගන්නා අතර මෙම ප්‍රසම්පාදනයෙන් පසු සිදු කරන ලද සියලුම ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් පත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 2019 අගෝස්තු 21 දින රිදියගම ගොවිපොළෙහි වැඩබලන කළමනාකරුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස පත් කර තිබියදී කළමනාකරු විසින් 2019 අගෝස්තු 22 දිනැති හා 2019 /ටෙන්ඩර් යන අංකය දරන සාමාන්‍යාධිකාරී වෙත ඇමතු ලිපිය මගින් | අදාළ විසිරුම් ජල පද්ධති ෆෝසයිට් ඉන්ජිනියරින් ඇග්‍රිගෝ පිවෙට් ආයතනයෙන් ආනයනය කරන ලද අතර මෙතෙක් භාවිතා කරන ලද පද්ධතින්ගේ ගුණාත්මක බව සලකා බලා ඒ හා සමාන ගුණාත්මක බවින් | ප්‍රසම්පාදනයන් විනිවිදභාවයෙන් යුතුව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගොවිපොළෙහි දැනට භාවිතා කරන විසිරුම් ජල පද්ධති 2 ම පෞද්ගලික නිෂ්පාදන ආයතනයක නියෝජිත ආයතනයයකින් ලබාගත් ඒවා බවත් එම ආයතනයෙන්ම නව යන්ත්‍ර ලබා ගැනීමේ වාසි, එම ආයතනයේ සේවාවන් වල ගුණාත්මකභාවය ඔහුගේ අත්දැකීම් හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සලකා බැලිය යුතු යෝජනා ඉදිරිපත් කර ඇත. මේ අනුව ඔහු තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමෙන් සියලු පාර්ශවයන්ට සාධාරණ, එක හා සමාන සහ උපරිම වශයෙන් සමාන අවස්ථා සලසා දීමේ ප්‍රසම්පාදන අරමුණ බිඳ වැටෙන බව නිරීක්ෂණය විය. | යුතු විසුරුම් ජල පද්ධතියක් මිල දී ගැනීමේ අරමුණින් මෙම පත් කිරිම සිදු කර ඇත. | |
| (iii) | ප්‍රසම්පාදනයට අදාළ පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජික ඉංජිනේරුවරිය විසින් සකස් කර එම කමිටුවේ අනුමැතිය සහිතව වැඩ බලන සාමාන්‍යාධිකාරී අනුමත කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 ප්‍රකාරව ඇස්තමේන්තුගත මුදලින් සියයට 1 සිට සියයට 2 දක්වා ප්‍රමාණයකට සමාන නිශ්චිත මුදලක් ලංසු සුරක්ෂණ වශයෙන් නියම කළ යුතු බව දන්වා තිබියදී ඊට පටහැනිව ලංසු සුරක්ෂණය ලෙස, කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2 ක බැංකු ඇපයක් පිළිගෙන තිබුණි . | මෙම ප්‍රසම්පාදනයෙන් පසු සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ලංසු සුරක්ෂණය ලබා ගැනීමට කටයුතු කර ඇත. | ඇස්තමේන්තුගත මුදලින් සියයට 1 සිට සියයට 2 දක්වා ප්‍රමාණයකට සමාන නිශ්චිත මුදලක් ලංසු සුරක්ෂණ වශයෙන් ගත යුතුය. |
| (iv) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ එකඟතාව මත විධිමත් ලෙස ලංසු විවෘත කිරීම් කමිටුවක් පත් කර නොමැති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසුකරුගේ නම, වැට් සහිත වැට් රහිත ලංසු මිල, ලංසු සුරක්ෂණය තිබෙන බැංකුව හා මුදල යන මූල්‍යමය තොරතුරු ඇතුළත් වාර්තා සටහන් පිළියෙල කර නොතිබුණි. | මෙම මිල ගණන් විධිමත් ලංසු විවෘත කිරීමේ කමිටුවක් යටතේ විවෘත කර ඇති අතර මූල්‍යමය තොරතුරු සහ අනෙකුත් තොරතුරු ඇතුළත් වාර්තා සටහනත් පිළියෙල කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මූල්‍යමය තොරතුරු ඇතුළත් වාර්තා සටහන් පිළියෙල කළ යුතුය. |
| (v) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2. ප්‍රකාරව විකල්ප ලංසු සලකා බැලීමට නම් එම ලංසුව සඳහා වෙනම ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත් ඉහළම මිල ගණන් ඉදිරිපත් කළ සමාගම විසින් රු.39,000,000 ක් ලෙස වූ විකල්ප ලංසුව සඳහා ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු නමුත් විකල්ප ලංසුව ඇගයීම සඳහා යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය. | මෙම යන්ත්‍ර 04 අදියර 02 ක් යටතේ යන්ත්‍ර 02 බැගින් මිල දී ගන්නා ලද අතර එම අවස්ථා 02 ක සඳහා වෙන වෙනම අදාළ සමාගම විසින් ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විකල්ප ලංසුව සඳහා ලංසු සුරක්ෂණයක් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 ප්‍රකාරව ලංසු ඇගයීම් සාරාංශ වාර්තාවක් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 ප්‍රකාරව ලංසු ඇගයීම් වාර්තා සකස් කළ යුතු වුවත් එසේ වාර්තා සකස් කර නොමැති අතර තාක්ෂණික ඇගයීම් රැස්වීම් වාර්තා සටහන පමණක් ඉදිරිපත් කර ඇත. | ලංසු ඇගයීම් සාරාංශ වාර්තාවක් පිළියෙල කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලංසු ඇගයීම් වාර්තා සකස් කළ යුතුය. |
| (vii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2. ප්‍රකාරව ඉංජිනේරු ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත්තුවෙන් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සමඟ විශාල වෙනසක් පෙන්නුම් කරයි නම් එම වෙනසට හේතු විශ්ලේෂණය කර ඇස්තමේන්තුව සමාලෝචනය කර සියලු ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ ලංසුව පිළිගැනීමට නම් අතිරේක කාර්යසාධන සුරක්ෂණ ඉල්ලුම් කිරීම ද කළ යුතුය. මෙම ප්‍රසම්පාදනයෙහි ඉංජිනේරු ඇස්තමේන්තුව(වැට් රහිත) රු. 28,400,000 වන අතර ලංසු කැඳවීම මඟින් තෝරාගත් සැපයුම්කරුගේ මිල (වැට් රහිත) රු.38,999,996කි. ඒ අනුව එම වටිනාකම ඇස්තමේන්තු පිරිවැයට වඩා සියයට 37 වැඩි නමුත් හේතු විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. | මෙම යන්ත්‍ර 04 අදියර 02 ක් යටතේ යන්ත්‍ර 02 බැගින් මිල දී ගන්නා ලද අතර එම අවස්ථා 02 ක සඳහා වෙන වෙනම අදාළ සමාගම විසින් ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර ඇත. | ඉංජිනේරු ඇස්තමේන්තුව හා ඉදිරිපත් කර ඇති මිල විශාල වෙනසක් පෙන්නුම් කරයි නම් ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ අතිරේක කාර්යසාධන සුරක්ෂණ ලබාගත යුතුය. |
| (viii) | ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව විසින් 2019 සැප්තැම්බර් 27 දින පැවති කමිටු රැස්වීමේදී විසිරුම් ජල පද්ධති 2 ක් හා ජල පොම්ප 1 ක් මිලදී ගැනීම සඳහා තීරණය කර තිබුණි. ඒ සඳහා ඉහත මිල ගණන් අනුව රු.19,499,998ක් වැය වන බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයේ අවශ්‍යතාවයෙන් අඩක් පමණක් ඉටු කරගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර අවම මිල ගණන් පිළිගත්තේ නම් එම මිල ඇස්තමේන්තු පිරිවැයට වඩා සියයට 27 (38,999,996/2-28,400,000/2)/19,499,998*100 වැඩි බව නිරීක්ෂණය විය. | ඒ වන විට මණ්ඩලයේ පැවති මූල්‍ය තත්ත්වය සලකා අදියර දෙකක් යටතේ අදාළ ජල විසිරුම් පද්ධති මිලදී ගැනීමට තීරණය කරන ලදී. | මණ්ඩලයට වඩාත් වාසි සහගත ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ix) | අවම මිල ගණන් ලෙස රු. 35,027,446 ක් හා දෙවන අවම මිල ගණන් ලෙස රු. 38,999,996 ක් සමාගම් 2 ක් විසින් ඉදිරිපත් කර තිබුණු අතර දෙවන අවම මිල ඉදිරිපත් කළ සමාගම මිලදී ගැනීම සඳහා තෝරාගෙන තිබූ නමුත් සාධාරණ පදනමකින් තොරව අවම මිල සහිත ආයතනය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් | අදාළ ආයතනයෙන් මිලදී නොගැනීම සඳහා හේතු තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාවෙන් දක්වා ඇත. | අවම මිල ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදුකර ඒ මත නිසි පියවර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයට රු.3,972,550 ක අලාභයක් ඇති වී තිබුණි. එහිදි වතුර පොම්ප දේශිය සන්නමක් යටතේ සැපයුම් කිරිම හේතු ලෙස දක්වා එම අවම මිල ගණන් ප්‍රතික්ෂේප කරන බව තාක්ෂණික ඇහයීම් කමිටු නිර්දේශයන්හි සඳහන් කර තිබුණු අතර 2019 අගෝස්තු 30 දින වැඩ බලන සමාන්‍යාධිකාරී විසින් මිල ගණන් අපැහැදිලි බැවින් වෙන් වෙන්ව නැවත මිල ගණන් ඉදිරිපත් කරන ලෙස සැපයුම්කරුට දන්වා ඇති අතර 2019 සැප්තම්බර් 05 දින වෙන් වෙන් ව මිල ගණන් ඉදිරිපත් කර ඇති නමුත් ඊට ප්‍රථම එනම් 2019 අගෝස්තු 23 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම සැපයුම්කරු වෙත ලංසු ප්‍රදානය සුදුසු බව දක්වා නිර්දේශ ලබා දී තිබුණි. මෙම ලංසුව අවම මිලට වඩා සියයට 11 කින් ඉහළ අගයක් ගෙන තිබුණි. | | |
| (x) | ලංසු කැඳවීම් ලේඛනයේ ලංසු ඇගයීමේ නිර්ණායකයක් ලෙස යන්ත්‍ර සවි කිරීම් කාලය උපරිම ඇනවුම් දින සිට දින 75 විය යුතු වුවත් තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ ලංසු ලේඛනයෙහි දින 120 ලෙස දක්වා ඇති බැවින් මෙම නිර්ණායකය ලංසු ප්‍රදානයේ දි සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. | අප විසින් යන්ත්‍ර සවි කිරීමේ උපරිම ඇනවුම් කාලය දින 75ක් ලෙස දක්වා ඇතත් අදාළ යන්ත්‍ර ආනයනය කර සවි කිරීම සඳහා ගත වන නියම කාලය දැනුවත් වන්නේ අදාළ ආයතනය විසින් බැවින් අදාළ ආයතනය විසින් ඉදිරිපත් කර ඇති කාලය සලකා බලා අදාළ පද්ධති මිලදී ගන්නා ලදී. | ලංසු ප්‍රදානයේදී යන්ත්‍ර සවි කිරීම් කාලය යන නිර්ණායකය සලකා බැලිය යුතුය |
| (ඒ) | මැණික්පාලම හා බෝපත්තලාව ගොවිපොළවල 2021 වර්ෂයේ කෙටුම්පත් ලාභ/අලාභ ගිණුම අනුව ගව ආහාර වියදම පිළිවෙලින් රු.95,042,252 ක් හා රු.80,101,231 ක් සහ එයින් 2021 ජූලි සිට 2021 දෙසැම්බර් දක්වා වූ ගව ආහාර වියදම පිළිවෙලින් රු.47,172,625 ක් හා රු.41,924,825 ක් වන අතර එය වර්ෂයේ මුළු ගව ආහාර වියදමින් පිළිවෙලින් සියයට 50 ක් හා සියයට 52 ක් වේ. 2021 ජූලි සිට 2021 දෙසැම්බර් දක්වා ගව ආහාර මිලදී ගැනීම් 02 ක සම්බන්ධයෙන් පහත දෑ නිරීක්ෂණය විය. | | |
| (i) | මැණික්පාලම හා බෝපත්තලාව ගොවිපොළවල 2021 ජූලි 01 වන දින සිට 2021 දෙසැම්බර් 31 වන දිනය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අවශ්‍ය ගව ආහාර පිළිවෙලින් ( මිල්කින් කව් මැෂ් ෆීඩ් - ටයිප් I) මෙට්‍රික් ටොන් 489.964 ක් හා 404.967 ක් , (මිල්කින් කව් මැෂ් ෆීඩ් - ටයිප් II) මෙට්‍රික් ටොන් 232.04 ක් හා 154.582 ක් ද කාෆ් ස්ටාර්ටර් පෙලේටඩ් ෆීඩ් මෙට්‍රික් ටොන් | මැණික්පාලම ගොවිපොළ සඳහා ඇස්තමේන්තු ගත මුලු පිරිවැය ඇතුළත් කොට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත.<br>බෝපත්තලාව ගොවිපොළෙහි සත්ත්ව ආහාර මිලදී ගැනීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවක් පිළියෙල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 6.143 ක් හා 8.325 ක් ලෙස මුළු ගවආහාර එකතුව මෙට්‍රික් ටොන් 728.147 ක් හා 567.874 ක් මිලදී ගැනීමට ජාතික තරඟකාරී මිල කැඳවීමේ ක්‍රමය යටතේ සිදුකිරීමට මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 , 4.2.2 හා 4.2.3 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | කර එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇති අතර ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොමැත. | |
| (ii) | මහවැලි ෆීඩ් මිල්ස් සමාගමට හා පැල්වත්ත ඩයිරි ඉන්ඩස්ට්‍රීස් සමාගමට ලංසු ප්‍රදානය කිරීමේ ප්‍රතිග්‍රහණ ලිපි යවා ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 8.9.3 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ප්‍රකාරව ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමක් සැපයුම්කරු සමඟ අත්සන් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට බෝපත්තලාව හා මැණික්පාලම ගොවිපොළ දෙකෙහිම විධිමත් පරිදි සත්ත්ව අහාර මිලදී ගැනීම් ටෙන්ඩර් ප්‍රදානය කිරීම් වලට අදාළව නියමිත කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගෙන ඇත. | සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමක් අත්සන් කළ යුතුය. |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ප්‍රකාරව හා මණ්ඩලයේ ලංසු ලේඛන අනුව තෝරාගන්නා ලද සැපයුම්කරුට ඇණවුම ප්‍රදානය කළ දින සිට දින 14 ක් ඇතුළත කාර්යයසාධන සුරක්ෂණයක් එම තෝරාගන්නා ලද සැපයුම්කරුගෙන් ලබාගත යුතු වුවද , විගණනයට ලබාදුන් ලිපිගොනුවේ ඇතුළත් 2021 සැප්තැම්බර් මස 27 වන දිනැති ලිපියට අනුව ඇණවුම ප්‍රදානය කර දින 87 ක් ගෙවී ගිය ද කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ සිට කාර්යයසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර ඇත. | දින 14 ක් ඇතුළත සැපයුම්කරුවන්ගෙන් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගත යුතුය. |
| (iv) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 (අ) (ii) ප්‍රකාරව රු.මිලියන 5 කට වැඩි කොන්ත්‍රාත් සඳහා කාර්යයසාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් සැපයුම්කාර ආයතනයේ නම පැහැරහැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව සති දෙකක් ඇතුළත ලිඛිතව හේතු දක්වන ලෙස නියම කරමින් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එම කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැන්වීමක් යැවිය යුතු වුව ද එසේ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට එසේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.11.4 (අ) (ii) ප්‍රකාරව කටයුතු කර ඇත . | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැන්වීමක් යැවිය යුතුය. |
| (v) | මහවැලි ෆීඩ් මිල්ස් සමාගම විසින් මිල වැඩි කිරීමක් සිදුකළ යුතු බව දන්වා තිබුණ ද , කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණේ නම් පසුව මිල වැඩි කිරීමක් සිදු කිරීම අවශ්‍ය නොවන අතරම කාර්ය සාධන සුරක්ෂණයක් | මහවැලි ෆීඩ් මිල්ස් සමාගම වෙත මණ්ඩලය සඳහා ගව ආහාර සැපයීම වෙනුවෙන් ඒ වන විටත් හිඟ මුදල් වශයෙන් ගෙවීමට මිලියන 24 ක මුදලක් තිබූ බැවින් අදාළ සමාගම | කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ සැපයුම්කරුගෙන් කාර්ය සාධන |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන තිබුණේ නම් එසේ මිල වැඩි වුවද එම වැඩි වූ ගව ආහාර මිලදී ගැනීමේ වියදම කාර්ය සාධන සුරක්ෂණය මඟින් ආවරණය කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි කර ගනිමින් අමතර පිරිවැයක් දරා නැවත Milking Cow Mash Feed (Type I) මැණික්පාලම ගොවිපොළට මෙට්‍රික් ටොන් 244.98 ක් හා බෝපත්තලාව ගොවිපොළට මෙට්‍රික් ටොන් 202.48 ක් සඳහා නැවත මිල ගණන් කැඳවා තිබුණි. | විසින් කාර්‍ය සාධනය සුරක්ෂිතයත් ඉදිරිපත් කිරීමට ප්‍රතික්ෂේපකර ඇති අතර සමාගම විසින් සත්ව ආහාර වල මිල ගණන් ඉහළ දැමීම හේතුවෙන් නැවත මිල ගණන් කැඳවීමට සිදු විය . | සුරක්ෂණයක් ලබා ගත යුතුය. |
| (ඔ) | බෝපත්තලාව ගොවිපොළෙහි 2021 වර්ෂයේ සතුන් අළෙවි කිරීමේ ලේඛන පරීක්ෂාවේදී ගොවිපොළ ආසන්නතම නගරය වූ ආගරපතන නගරයේ ගැණුම්කරුවන් දෙදෙනෙකු පමණක් අයදුම්පත් කැඳවීම සඳහා තෝරාගෙන තිබුණු බවත් අනෙකුත් ගැණුම්කරුවන් සියලුම දෙනා කොළඹ, වැලිසර, නුවරඑළිය අතර දුරස්ථ ප්‍රදේශ වල සැපයුම්කරුවන් බවත් එසේ දුරස්ථ ගැණුම්කරුවන් වෙනුවෙන් අයදුම්පත් යොමු කිරීම ප්‍රතික්ෂේප කර ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අදාළ ටෙන්ඩර්පත් වෙනුවෙන් අයදුම්පත් යොමුකිරීම ද ආගරපතන ගැණුම්කරුවන් දෙදෙනාට සීමා කර තිබුණු අතර එම නිසා වෙනත් ගැණුම්කරුවන්ගෙන් උපරිම මිලක් ලබා ගැනීමට තිබුණු අවස්ථාව ගොවිපොළට අහිමි වී තිබුණි. එසේම ගොවිපොළ විසින්, ආගරපතන නගරය ආදී ගොවිපොළ ආසන්නයේ ඇති නගරවල ගැණුම්කරුවන් වැඩි පිරිසක් තෝරාගෙන අයදුම්පත් කැඳවීම තුළින් වැඩි ටෙන්ඩර්පත් ප්‍රමාණයක් ලබා ගැනීමට මෙන්ම වැඩි මිලක් ඉදිරිපත් කරන ගැණුම්කරුවකු තෝරා ගැනීමට ගොවිපොළට තිබුණු අවස්ථාව අහිමි වී ඇති බවත් නිරීක්ෂණය විය. | මෙම සතුන් මිලදී ගැනීම සඳහා ගැනුම්කරුවන් 30ක පමණ ප්‍රමාණයකට අයදුම්පත් කැඳවා ඇති නමුත් මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ ගැනුම්කරුවන් දෙදෙනෙක් පමණි. ප්‍රවාහන දුෂ්කරතා සහ ප්‍රවාහනය සඳහා වැය වන අධික වියදම හේතුවෙන් වෙනත් ප්‍රදේශ වලින් ගැනුම්කරුවන් හෝ සැපයුම්කරුවන් ගොවිපොළෙහි සතුන් මිලදී ගැනීම සහ ගොවිපොළට භාණ්ඩ සැපයීම ප්‍රතික්ෂේප කරනු ලබයි. | සැපයුම්කරුවන් වැඩි පිරිසකගෙන් අයදුම්පත් කැඳවීම තුළින් ඉහළම මිලක් ලබා ගත යුතුය. |

**3.7 වෙනත් සංවිධාන වලට අදාළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ දී මණ්ඩලය සතු රු.මිලියන 167.1 ක් වටිනා ඉඩම් අක්කර 440 ක ප්‍රමාණයක් BOI ආයතනය වෙත ලබා දී ඇති බව නිරීක්ෂණය වූ අතර භාර දීම සම්බන්ධව කිසිදු නීතිමය ලියවිල්ලක් මණ්ඩලය සතුව නොතිබුණි.. | මෙය රජයේ තීරණයක් මත ලබාගෙන ඇත. | මණ්ඩලය සතු ඉඩම් බැහැර කිරීමේදි නීතිමය පිළිවෙතක් අනුගමනය කළ යුතුය. |

**3.8. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 ,2020 ,සහ 2021 වර්ෂ වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 33 ක් 12ක් සහ 38 වූ ද තෘතියික මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 12ක් 10 ක් සහ 14 ද ද්විතීක මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 7ක් 22ක් සහ 7 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 42 ක් 102 ක් 113 ද වූ අතර 2020 වර්ෂයේ ප්‍රාථමික මට්ටමේ සේවක අතිරික්තය 64 ද 2021 වසරේ ජ්‍යෙෂ්ඨ මට්ටම ද්විතීක මට්ටම සහ ප්‍රාථමික මට්ටම සේවක අතිරික්ත පිළිවෙලින් 8ක් 2ක් සහ 61 විය. | පුරප්පාඩු ඇති වී ඇත්තේ MM 1-1 ඛණ්ඩයේ 1 වන ශ්‍රේණියේ තනතුරු වන ගොවිපොළ කළමනාකාර හා ප්‍රධාන කාර්යාලයේ කළමනාකාර තනතුරු 35 හේතුවෙනි.<br>සහකාර කළමනාකාර තනතුරේ වසර 10 ට වඩා වැඩි පළපුරුද්දක් ඇති සේවකයින් නොමැති වීමෙන් මෙම පුරප්පාඩු පෙන්නුම් කරයි.<br>තෘතීය මට්ටමේ තනතුරු ද්විතීය මට්ටමේ නිළධාරින්ගේ උසස් වීම් සඳහා පවත්වා ගෙන යන අතර පිටතින් නිලධාරින් බඳවා නොගැනීමේ හේතුවෙන් මෙම පුරප්පාඩු පවතී.<br>• ද්විතීය මටටමේ පුරප්පාඩු පැවතීමට හේතුව ලෙස මණ්ඩලයේ ක්ෂේත්‍ර පශු සහකාර (MA 1-2) තනතුරේ සිටින නිලධාරින් වරින් වර රැකියා සඳහා විදේශ ගතවීම හා මණ්ඩලීය සේවයෙන් ඉල්ලා අස්වීමය .<br>• ප්‍රාථමික ගණයේ තනතුරු වල අතිරික්තයක් පෙන්නුම් කරනුයේ කිරි අලෙවි සැල් සඳහා අලෙවි සහායකයින් බඳවා ගෙන තිබුණද බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වී නොමැති බැවින්ය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත සේවකයින් සඳහා අනුමැතියක් ලබා ගත නොහැකි නම් ඒවා නීති විරෝධී බඳවා ගැනීම් සේ සලකා ක්‍රියා කළ යුතුය |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර අවු.02 මාස 07 ක කාලයක් ද අභ්‍යන්තර විගණන තනතුර අවු.02 මාස 07 ක කාලයක් පුරප්පාඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. | සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) තනතුරේ පුරප්පාඩුව 2023 පෙබරවාරි මස 01 වෙනි දින පිරවීමට කටයුතු කරන ලදී. අභ්‍යන්තර විගණන තනතුරට ද මණ්ඩලයේ අනුමත බඳවා ගැනිමේ පටිපාටිය අනුව පිටතින් පිරවිය නොහැකි අතර සහකාර කළමනාකාර තනතුරේ වසර 10 ට වඩා වැඩි පළපුරුද්දක් ඇති සේවකයින් නොමැති වීමෙන් මෙම පුරප්පාඩුව පෙන්නුම් කරයි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**3.9 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැණික්පාලම ගොවිපොළෙහි තෘණ ප්‍රවාහන සඳහා භාවිතා කරන, 044- 4856 , 045- 7370 , යන Trailor සඳහා ලිපිගොනු නඩත්තුකර නොතිබුණි. | 44-4856 සහ 45-7370 යන ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා ලිපිගොනුවක් මැණික්පාම ගොවිපොළ මගින් නඩත්තු නොකරන අතර අදාළ ලිපි ගොනු නඩත්තුකිරීම සඳහා කළමනාකරීත්වයට උපදෙස් ලබාදීමට කටයුතු කරමි. | වාහන සඳහා නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) | අඹගස්දෝව ගොවිජන මධ්‍යස්ථානයේ 49- | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් | භාවිත |

| | | | |
|---|---|---|---|
| | 1908 අංක දරන කුබෝටා ට්‍රැක්ටරය 2020 ජූලි 29 දින සිට අයිතිය පවරාගැනීමකින් තොරව බෝපත්තලාව ගොවිපොළෙහි භාවිතයට ගෙන ඇති අතර එම ට්‍රැක්ටරය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉහත වර්ෂ දෙක සඳහාම ධාවන සටහන් නඩත්තු කර නොතිබුණි. | භාවිතයට නොගන්නා කෘෂි යන්ත්‍රෝපකරණ මණ්ඩලයේ ඉල්ලීම පරිදි ගොවිපොළවල වගාකටයුතු සඳහා යොදා ගැනීමට ලබාදී ඇති අතර එම යන්ත්‍ර අතුරින් ලියාපදිංචි හිමිකම ලබාගතයුතු යන්ත්‍ර සූත්‍ර වල ලියාපදිංචි හිමිකම මණ්ඩලය වෙත ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | කරන යන්ත්‍රෝප කරණ අයිතිය පවරාගැනීම ට කටයුතු කළ යුතුය. |
| (ඇ) | GB- 4430 අංක දරන ට්‍රැක්ටරය 2020 වර්ෂයේ සිට භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී ඇති අතර 2022 මාර්තු 10 වන විටත් අලුත්වැඩියා නොකර මැණික්පාලම ගොවිපොළෙහි ගාල්කර තිබුණි. | GB-4430 දරන මහින්ද්‍රා වර්ගයේ ට්‍රැක්ටරය මැණික්පාලම ගොවිපොළ අයත් නොවන අතර විගණන් විමසුමේ දක්වා ඇති කාලය තුළ බෝපත්තලාව ගොවිපොළේ ගාල්කර තිබුණි. සුළු අලුත්වැඩියා කටයුතු හේතුවෙන් අවශ්‍ය අමතර කොටස් සම්පාදනය කරගන්නා තෙක් ධාවනයෙන් ඉවත්කර ඇත. | ට්‍රැක්ටරය අලුත්වැඩි යා කර භාවිතයට ගත යුතුයි. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 - 2020 සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම හා 2020 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැයෙහි ආදායම, වියදම සැලකීමේදී ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විය. නමුත් ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව එම විචලනයන් නිවැරදි කර 2019 සිට ඉදිරියට යාවත්කාලීන කරන ලද අනුමත සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂිකව සංයුක්ත සැලැස්ම සමාලෝචනය කර සංශෝධනය කළ යුතු කොටස් සංශෝධනය කිරිම නිවැරදිව<br>සිදු නොවීම හේතුවෙන් මෙම දෝෂ සිදු වී ඇති බැවින් ඉදිරියේදී වාර්ෂිකව සංයුක්ත සැලැස්ම සංශෝධනය කිරිමට කටයුතු කෙරේ. | සංයුක්ත සැලැස්මට ඉදිරි යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පි.ඊ.ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මට අන්තර්ගත විය යුතු වර්තමානයේ ආයතනය සතුව පවතින තාක්ෂණික දැනුම, වෙළඳපොළවල් හා සැපයුම්කරුවන් , සැලසුම් කාලසීමාව තුළ ඉටුකළ යුතු ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කළමනාකරණ වගකීම යන කරුණු 2016-2020 හා 2021 - 2025 සංයුක්ත සැලසුම්වලට ඇතුළත් කර නොතිබුණු අතර | ඉදිරියේදී අඩුපාඩු මගහරවා ගනිමින් සංයුක්ත සැලැස්ම සකස් කිරිමට කටයුතු කෙරේ. | සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිෂ්පාදන සහ මෙහෙයුම් පහසුකම් , මානව සම්පත් හා කළමනාකරණ කුසලතා , සංවිධාන ව්‍යුහය සම්බන්ධ තොරතුරු 2016-2020 සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.<br><br>තවද මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන , වරලත් අලෙවිසැල්, කිරි ව්‍යාපෘති හා ප්‍රධාන කාර්යාලයීය අලෙවිසැල යන ව්‍යාපෘතින් සම්බන්ධ සැලසුම් කාලසීමාවට අදාළ ආදායම් , වියදම් , ඉලක්ක හා වෙනත් තොරතුරු 2016-2020 හා 2021 - 2025 සංයුක්ත සැලැසුම්වලට ඇතුළත් කර නොතිබුණි. | | |
| • | 2019 හා 2020 වර්ෂවල පොල් ව්‍යාපෘතියේ වියදම සැලකීමේදී ගොවිපොළ 03 ක හා ගොවිපොළ 02 ක අයවැයෙහි වියදම සංයුක්ත සැලැස්මෙහි වියදමට වඩා සියයට 18 සිට 46 ක් දක්වා හා සියයට 05 සිට 11 ක් දක්වා වැඩියෙන් දැක්වීමක්ද , ගොවිපොළ 12 ක හා ගොවිපොළ 13 ක අයවැයෙහි වියදම සංයුක්ත සැලැස්මෙහි වියදමට වඩා සියයට 04 සිට 55 ක් දක්වා හා සියයට 03 සිට 62 ක් දක්වා අඩුවෙන් දැක්වීමක් ලෙස වෙනසක් නිරීක්ෂණය විය. ඊට අමතරව 2019 වර්ෂයේ දී ගොවිපොළ 04 ක හා 2020 වර්ෂයේ දී ගොවිපල 05 ක වියදම සංයුක්ත සැලැස්මෙන් අත්හැර තිබුණි. | වාර්ෂිකව සංයුක්ත සැලැස්ම සමාලෝචනය කර සංශෝධනය කළ යුතු කොටස් සංශෝධනය කිරිම නිවැරදිව සිදු නොවිම හේතුවෙන් මෙම දෝෂ සිදු වි ඇති බැවින් ඉදිරියේදි වාර්ෂිකව සංයුක්ත සැලැස්ම සංශෝධනය කිරිමට කටයුතු කෙරේ. | සංයුක්ත සැලැස්මට ගැලපෙන පරිදි අයවැයෙහි ඇතුළත් කළ යුතු සියලු තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පි.ඊ.ඩි 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් 2016 - 2020 සංයුක්ත සැලැස්ම 2016 ඔක්තෝබර් 27 දින අනුමත කර 2017 ජූලි 12 දින වන ලෙස හා 2021 - 2025 සංයුක්ත | මණ්ඩලය විසින් පසුගිය වර්ෂවල සංයුක්ත සැලැස්ම විගණකාධිපතිට ඉදිරිපත් කිරිමක් සිදු කර නොමැති අතර විගණන අවශ්‍යතාවය පරිදි විගණකාධිපතිවරයාගේ ඉල්ලිමට අනුව එම වාර්තාව ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදි එම වාර්තාව අඛණ්ඩව විගණකාධිපතිට යැවිමට කටයුතු කෙරේ. කෙසේ නමුත් එහි සදහන් කර ඇති පරිදි අනෙකුත් ආයතන වෙත එම සැලැස්ම ඉදිරිපත් කිරිම පිළිබදව ප්‍රමාදයක් සිදු වි ඇති බව පිළිගන්නා අතර ඉදිරියේදි එසේ නොවිමට කටයුතු කෙරෙනු ඇත. | සංයුක්ත සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් අදාළ ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලැස්ම 2021 පෙබරවාරි 25 වන දින අනුමත කර 2022 මාර්තු 15 දින වන ලෙස ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) | 2016-2020 සංයුක්ත සැලැස්මේ, ඔයාමඩුව, නිකවැරටිය, මැදරට පශුසම්පත් සංවර්ධන මණ්ඩලය,පොළොන්නරුව හා වීරවිල යන ගොවිපොළවල නිවාඩු නිකේතන පවත්වාගෙන යාම සහ එමගින් ලාභ ඉපැයීම, ගල්පොකුණ ගොවිපොළේ ගොවිපුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා පැවැත්වීම, මහබෙරියතැන්න ගොවිපොළෙහි ගම්මිරිස් හා පලතුරු වගාකිරිම යන අරමුණු දක්වා තිබුණ ද , 2019 හා 2020 වර්ෂවලදී ක්‍රියාකාරි සැලසුම්වල එවැනි ක්‍රියාකාරකම් සැලසුම් කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා සකස් කරනු ලබන ක්‍රියාකාරි සැලැස්මට නිවාඩු නිකේතන සම්බන්ධ විස්තර හා ගල්පොකුණ පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා පැවැත්වීම, මහබෙරියතැන්න ගොවිපොළේ ගම්මිරිස් හා පලතුරු වගාකිරිම යන අරමුණු ඇතුළත් කිරීමට කටයුතු කෙරේ . | සංයුක්ත සැලැස්මේ ඇති ක්‍රියාකාරකම් ක්‍රියාකාරි සැලස්මට නිවැරදි ලෙස ගත යුතුය. |
| (ඉ) | සංයුක්ත සැලැස්මේ 2019 වර්ෂයේ දී ගොවිපොළවල් 15 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණු ක්‍රියාකාරකම් 9 ක් හා ගොවිපොළවල් 19 ක් යටතේ 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණු ක්‍රියාකාරකම් 09 ක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් ක්‍රියාකාරි සැලැස්මේ දී සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර හෝ නොතිබුණි. | අදාළ ක්‍රියාකාරකම් සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර තිබුණ ද අදාළ වර්ෂයෙහි එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට තීරණය කළහොත් පමණක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සංයුක්ත සැලැස්මේ ඇති ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට නිවැරදි ලෙස ගත යුතුය |

**4.2 ක්‍රියාකාරි සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 (2) ඡේදය ප්‍රකාරව ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු අතර පිළියෙල කළ 2019 හා 2020 වර්ෂවල ක්‍රියාකාරි සැලැස්මට අන්තර්ගත විය යුතු වැලිසර ගොවිපොළ පිළිබඳ විස්තර ද , 2019 , 2020 හා 2021 යන වර්ෂවල ක්‍රියාකාරි සැලැස්මට අන්තර්ගත විය යුතු කිරි ව්‍යාපෘතිය , වරලත් අලෙවිසැල් හා ප්‍රධාන කාර්යාලයේ අලෙවිසැල යන | එම අඩුපාඩු ඉදිරියේදි මගහරවා ගැනිමට කටයුතු කෙරේ. | චක්‍රලේඛ පරිදි ක්‍රියාකාරි සැලැස්ම නියමිත දින ඉදිරිපත් කළ යුතු අතර එහි අන්තර්ගත විය යුතු තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අංශවල ක්‍රියාකාරිත්වය, වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් වියයුතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශය , ණය ආපසු ගෙවීමේ සැලැස්ම , යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර යන කරුණු ඇතුළත් වී නොතිබුණි. | | |
| (ආ) | 2019 , 2020 හා 2021 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම් තුළ ඇතුළත් පිළිවෙලින් ගොවිපොළ 16 ක ව්‍යාපෘති 05 කට අදාළ ක්‍රියාකාරකම් 24 ක් , ගොවිපොළ 13 ක ව්‍යාපෘති 02 කට අදාළ ක්‍රියාකාරකම් 20 ක් හා ගොවිපොළ 25 ක ව්‍යාපෘති 08 කට අදාළ ක්‍රියාකාරකම් 166 ක් එම වර්ෂ තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු අතර ක්‍රියාත්මක නොකිරිමට හේතුන් ද කාර්යසාධන වාර්තාවේ අනාවරණය කර නොතිබුණි | අප ආයතනය විසින් ප්‍රමුඛවම සත්ත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බැවින් එම ව්‍යාපෘතිවල කෙටිකාලීනව සිදුවන වෙළඳපොළ වෙනස්වීම් සහ ඉල්ලුම යනාදී සාධක හේතුවෙන් නිෂ්පාදනය නිරන්තරයෙන්ම උච්චාවචනය වන බැවින් යම් යම් සැලසුම් | ක්‍රියාකාරී සැලැසුම් වල දැක්වෙන ප්‍රගතිය ලබාගත යුතුය. |
| (ඇ) | 2019 , 2020 හා 2021 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම් තුළ ඇතුළත් පිළිවෙලින් ගොවිපොළ 24 ක ව්‍යාපෘති 08 කට අදාළව ක්‍රියාකාරකම් 58 ක ,ගොවිපොළ 27 ක ව්‍යාපෘති 08 කට අදාළව ක්‍රියාකාරකම් 87 ක හා ගොවිපොළ 29 ක ව්‍යාපෘති 11 කට අදාළව ක්‍රියාකාරකම් 265 ක ප්‍රගතිය සියයට 1 ත් සියයට 49 ත් අතර අගයන් ගෙන තිබුණු අතර අදාළ ප්‍රගතියට ළඟා නොවීමට හේතුන් ද දක්වා නොතිබුණි. | කරන ලද ක්‍රියාකාරකම් ඒ ආකාරයෙන්ම සිදු කර ගැනිමට නොහැකි වන අවස්ථා ඇත. මුදල් ප්‍රතිපාදන ආදි විවිධ ප්‍රායෝගික ගැටලු හේතු කරගෙන එම කාර්ය සාධනයන් ඉලක්ක ගත පරිදි ඉටු කර ගැනිමට නොහැකි වී ඇත. 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරය නිසා වෙළඳපොළ අවිනිශ්චිතවීම්, 2020,2021 කොවිඩ් වසංගතය නිසා කෘෂි නිපැයුම් පහළ යාම | ක්‍රියාකාරී සැලසුම් වල දැක්වෙන ප්‍රගතිය ලබාගත යුතුය. |
| (ඈ) | 2020 හා 2021 වර්ෂවල කාර්යයසාධන සාරංශ වාර්තා සැසඳූ විට 2020 වර්ෂයට සාපේක්ෂව ව්‍යාපෘති 04 ක ක්‍රියාකාරකම් 15 ක සත්‍ය නිමැවුම සියයට 2 සිට 90 ක ප්‍රතිශතයක් දක්වා ද , ව්‍යාපෘති 06 ක ක්‍රියාකාරකම් 15 ක සත්‍ය නිමැවුම සියයට 4 සිට 98 ක ප්‍රතිශතයක් දක්වා ද අඩු වී ඇති බව නිරීක්ෂණය විය. | ආදි අපට පාලනය කළ නොහැකි බාහිර සාධක හේතුවෙන්, බොහෝමයක් ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ තිබූ පරිදි ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි විය. | ක්‍රියාකාරකම්හි කාර්ය සාධන ඉහළ නංවා ගත යුතුය . |

(ඉ) ක්‍රියාකාරී සැලසුම අනුව 2019-2021 දක්වා මණ්ඩලයේ අපේක්ෂිත කිරි නිෂ්පාදනය සහ කාර්ය සාධන වාර්තාවට අනුව තත්‍ය කිරි නිෂ්පාදනය පහත පරිදි අඩුවීමක් නිරීක්ෂණය විය.

| වර්ෂය | ක්‍රියාකාරී සැලසුම අනුව අපේක්ෂිත කිරි නිෂ්පාදනය(ලීටර් මිලියන) | කාර්යයසාධන වාර්තාවට අනුව තත්‍ය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | අඩුවීම (ලීටර් මිලියන) |
|---|---|---|---|
| 2019 | 17.91 | 12.43 | 5.48 |
| 2020 | 15.11 | 12.03 | 3.08 |
| 2021 | 15.22 | 9.7 | 5.52 |

2019,2020,2021 යන වර්ෂවල පැවති කෘෂිකාර්මික හා ආර්ථික ගැටලුවලට සෘජුවම ලක්වීම නිසා ඉලක්ක ගත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි වීමට හේතු වී ඇත

අපේක්ෂිත කිරි ඵලදාව ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය

(ඊ) සංයුක්ත සැලසුම අනුව අපේක්ෂිත කිරි නිෂ්පාදනය හා කාර්යයසාධන වාර්තාවට අනුව තත්‍ය කිරි නිෂ්පාදනය පහත පරිදි අඩුවීමක් නිරීක්ෂණය විය.

| වර්ෂය | සංයුක්ත සැලසුම අනුව අපේක්ෂිත කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | කාර්යය සාධන වාර්තාවට අනුව තත්‍ය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | අඩුවීම (ලීටර් මිලියන) |
|---|---|---|---|
| 2019 | 23.54 | 12.43 | 11.11 |
| 2020 | 23.92 | 12.03 | 11.89 |
| 2021 | 14.8 | 9.7 | 5.1 |

2019,2020,2021 යන වර්ෂවල පැවති කෘෂිකාර්මික හා ආර්ථික ගැටලුවලට සෘජුවම ලක්වීම නිසා ඉලක්ක ගත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි වීමට හේතු වී ඇත

අපේක්ෂිත කිරි ඵලදාව ළඟාකර ගැනිමට කටයුතු කළ යුතුය.

(උ)ආනයනික කිරිගවයින් සිටින මැණික්පාලම, බෝපත්තලාව හා රිදියාගම ගොවිපොළවල ආනයනික කිරිගවයින්ගෙන් 2018 , 2019 , 2020 හා 2021 වර්ෂයේ දී ලබාගත් කිරි නිෂ්පාදනයන් පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය

2019,2020,2021 යන වර්ෂවල පැවති කෘෂිකාර්මික හා ආර්ථික ගැටලුවලට සෘජුවම ලක්වීම නිසා ඉලක්කගත නිෂ්පාදනය ලබා ගැනිමට නොහැකි වීමට හේතු වි ඇත.

ආනයනික කිරිගවයින් සිටින ගොවිපොළවල් කිරි ඵලදාව ළඟාකර ගැනිමට කටයුතු කළ යුතුය.

**කිරි නිෂ්පාදනය ( ලීටර්)**

| ගොවිපොළ | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| -------------- | ------- | ------- | ------- |
| මැණික්පාලම | 1,537,665 | 1,395,705 | 1,226,559 |
| රිදියාගම | 7,132,284 | 6,827,458 | 4,864,983 |
| බෝපත්තලාව | 1,134,265 | 1,169,795 | 1,116,391 |

(ඌ)දේශීය කිරිගවයින් සිටින ගොවිපොළවල් 14 ක කිරිගවයින්ගෙන් 2018,2019 හා 2020 වර්ෂවල දී ලබාගත් කිරි නිෂ්පාදනයන් පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

**කිරි නිෂ්පාදනය ( ලීටර්)**

| ගොවිපොළ | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| ------------- | ------- | ------- | ------- |
| - | ලීටර | ලීටර | ලීටර |
| නිකවැරටිය | 88,452 | 64,646 | 54,467 |
| රුක්අත්තන | 146,009 | 115,240 | 100,714 |
| මරදවිල | 109,513 | 69,639 | 81,832 |
| ඔයාමඩුව | 56,676 | 51,714 | 48,855 |
| මැල්සිරිපුර | 166,615 | 130,657 | 104,702 |
| රොසිටා | 107,468 | 114,366 | 93968 |
| කොවුල්වැව | 212,019 | 209,477 | 253,422 |
| මහබේරිය තැන්න | 76,090 | 77,663 | 74113 |
| සිරිංගපාත | 85,572 | 80,354 | 75,457 |
| ආඩිගම | 237,209 | 238,241 | 220,883 |

2019,2020,2021 යන වර්ෂවල පැවති කෘෂිකාර්මික හා ආර්ථික ගැටලුවලට සෘජුවම ලක්වීම නිසා ඉලක්ක ගත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි වීමට හේතු වී ඇත.

දේශීය කිරිගවයින් සිටින ගොවිපොළවල් කිරි එලදාව වැඩිකර ගැනිමට කටයුතු කළ යුතුය.

(එ) මී ගවයින් සිටින ගොවිපොළවල් 05 ක මී ගවයින්ගෙන් 2019,2020 හා 2021 වර්ෂයේ දී ලබාගත් කිරි නිෂ්පාදනයන් පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

2019,2020,2021 යන වර්ෂවල පැවති කෘෂිකාර්මික හා ආර්ථික ගැටලුවලට සෘජුවම ලක්වීම නිසා ඉලක්ක ගත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි වීමට හේතු වී ඇත.

මී ගවයින් සිටින ගොවිපොළවල කිරි එලදාව වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය.

කිරි නිෂ්පාදනය ( ලීටර්)

| ගොවිපොළ | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| -------------- | ------ | ------- | ------- |
| වීරවිල | 73,150 | 37,830 | 38,561 |
| පොළොන්නරුව | 263,912 | 217,842 | 199,652 |
| නිකවැරටිය | 50,086 | 52,175 | 59,250 |
| මැල්සිරිපුර | 120,604 | 124,380 | 115,982 |
| මරඳවිල | 167,451 | 149,975 | 173,749 |

| | | |
|---|---|---|
| (ඔ)පොල් ව්‍යාපෘතිය යටතේ සිදුකරන පොල්ගෙඩි නිෂ්පාදනය සම්බන්ධයෙන් 2020 හා 2021 වර්ෂවල ක්‍රියාකාරි සැලැසුම් අනුව ලබාගැනීමට අපේක්ෂිත පොල් ගෙඩි ප්‍රමාණය පිළිවෙලින් 20,778,985 ක් හා 20,631,018 ක් ද , 2020 හා 2021 වර්ෂවල කාර්යයසාධනයන් අනුව සත්‍ය වශයෙන්ම ලබාගෙන ඇති පොල් ගෙඩි ප්‍රමාණය පිළිවෙලින් 13,860,239 ක් හා 17,018,801 ක් විය. | ඉදිරියේදි එවැනි අඩුපාඩු නොවන ලෙස හා ක්‍රියාකරි සැලැස්ම සැකසීමට කටයුතු කෙරේ. | ක්‍රියාකාරි සැලසුම් අනුව ලබාගැනීමට අපේක්ෂිත නිෂ්පාදනය ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ)ඇසුරුම් කළ දියර කිරි (Fresh milk) වෙනුවෙන් වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති අතර අනෙකුත් තරඟකාරි ආයතන එම වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කළ ද ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය රටෙහි ප්‍රධානතම කිරි නිෂ්පාදකයා වුවත් එවැනි අවස්ථාවන් හඳුනාගෙන වර්තමාන කාලයට ගැලපෙන පරිදි කටයුතු කර වෙළඳපොළ කොටස වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි . | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනාගෙන අපට පැවරි ඇති විෂය පථය තුළ කටයුතු කරමින් පවති. එහිදි දියර කිරි, අගය එකතු කළ නිෂ්පාදන බවට පත්කිරීම අත්‍යවශ්‍ය කරුණක් වුවත් පවතින ප්‍රතිපාදන යටතේ අප ආයතනය සතු ආයෝජනය කිරීමේ හැකියාව ක්‍රමයෙන් අගය එකතු කිරීමේ නිෂ්පාදන වැඩි කරමින් පවතී. | වෙළඳපොළ කොටස වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති අංක පි.ඊ.ඩි 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය ආරම්භවීමට තෙමසකට පෙර කෙටුම්පත් අයවැයට අනුමැතිය ලබාදීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර 2019 , 2020 හා 2021 ක වර්ෂවල පිළිවෙලින් අයවැය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2019 පෙබරවාරි 26 , 2020 පෙබරවාරි 02 හා 2021 දෙසැම්බර් 24 වන දින දීය. | ඉදිරියේදී මෙම දුර්වලතාවයන් මඟහරවා ගැනීමට පියවර ගන්නා බව දන්වමි. | චක්‍රලේඛයේ පරිදි තෙමසකට පෙර කෙටුම්පත් අයවැයට අනුමැතිය ලබාගත යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන්ද, හඳුනාගෙන නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසාර සංවර්ධන අරමුණු වඩාත් නිවැරදි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යංශ මට්ටමින් හෝ වෙනත් ආකාරයෙන් වැඩමුළුවක් පවත්වා දැනුවත් කළ යුතුව ඇත. | තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම කටයුතු කළ යුතුය. |